SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2017 ජනවාරි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංකය (AA25)

## ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම
## (BLE)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA2 විභාගය - 2017 ජනවාරි
## (AA25) ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

අනිවාර්ය ප්‍රශ්න දහයකි. (10)

(මුළු ලකුණු 20)

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්නය | උත්තරය |
|---|---|
| 1.1 | (4) |
| 1.2 | (3) |
| 1.3 | (4) |
| 1.4 | (4) |
| 1.5 | (4) |
| 1.6 | (3) |
| 1.7 | (1) |
| 1.8 | ප්‍රකාශන අයිතිය<br>කාර්මික සැලසුම් (Industrial Designs)<br>වෙළෙඳ ලකුණු සහ සේවා ලකුණු (Trademarks and Service Marks)<br>වෙළෙඳ නාම (Trade Names)<br>භූගෝලීය දර්ශකයන් (Geographical Indications) |
| 1.9 | මූල්‍ය කල්බදු (Finance lease)<br>මෙහෙයුම් කල්බදු (Operating lease)<br>විකුණුම් සහ කල්බදු (Domestic lease) |
| 1.10 | වෙළෙඳ නිවාඩු (Mercantile Holidays)<br>පොහොය නිවාඩු<br>ප්‍රසිද්ධ නිවාඩු<br>වාර්ෂික නිවාඩු<br>අනියම් අසනීප නිවාඩු<br>ප්‍රසූත නිවාඩු - කාන්තාවන් සඳහා |

(ලකුණු 20)

***A* කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**ණයවර ලිපි (Letter of credit)**

මේවා අන්තර්ජාතික වාණිජ්‍ය මණ්ඩලයේ 'ඒකීය චාරිත්‍ර සහ පරිචයන්' "Uniform Customs and Practices" (UCP) මගින් පාලනය වේ. ණයවර ලිපි ක්‍රියාත්මක වීමේ පියවරයන් පහත පරිදි වේ.

1) එක් රටක සිටින විකුණුම්කරුත් තවත් රටක සිටින ගැනුම්කරුත් අතර භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් ඇතිවේ.
2) විකුණුම්කරු නමින් ණයවරයක් විකුණුම්කරුගේ බැංකුවේ විවෘත කරන ලෙස ගැනුම්කරු විසින් ගැනුම්කරුගේ බැංකුවට උපදෙස් ලබාදෙයි. මෙහිදී විකුණුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන මොනවාද යන්නත් ගැනුම්කරු විසින් ගැනුම්කරුගේ බැංකුවට දැනුම් දේ.
3) විකුණුම්කරුගේ බැංකුව විසින් විකුණුම්කරුට මුදල් ගෙවනු ලබන අතර විකුණුම්කරු අදාළ ලේඛන විකුණුම්කරුගේ බැංකුව වෙත භාරදීම සිදු කරයි.
4) විකුණුම්කරුගේ බැංකුව අදාළ ලේඛන ගැනුම්කරුගේ බැංකුව වෙත ලබාදෙන අතර ගැනුම්කරුගේ බැංකුව විසින් විකුණුම්කරුගේ බැංකුව වෙත මුදල් ගෙවීම සිදු කරනු ලබයි.

(ලකුණු 05)

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

සාමාන්‍ය හෝ විශේෂ රේඛනයක් සහිත චෙක්පත්‍රයක 'ගනුදෙනු කළ නොහැක' යන වචන ලියා තිබුණ ද, එම චෙක්පත් ඕනෑම ගනුදෙනු කටයුත්තක් සඳහා යොදා ගැනීමටත්, වෙනත් අයට පවරා දීමටත් හැකියාව ඇත.

මෙම වචන ලිවීම මගින් ඇති වන එකම නෛතික බලපෑම වන්නේ, එමගින් චෙක්පතේ ධාරක, යථාකාල ධාරකයෙකු වීම වැළැක්වීමයි.

එනම් මෙවැනි චෙක්පතක් ලද අයෙකුට, චෙක්පතේ පැවරුම්කරුට ඇති හිමිකමේ දෝෂවලින් තොරව හොඳ හිමිකමක් ඉල්ලා සිටිය නොහැකිවීමයි.

එනම් පැවරුම්කරුගේ හිමිකම දෝෂසහගත නම් පැවරුම්ලාභියාට හිමිවන්නේ දදෝෂ සහගත හිමිකමක් වේ. මෙහිදී පැවරුම්කරුගේ හිමිකම දෝෂසහගත නිසා 'ඩී'ට මෙම චෙක්පතේ මුදල ඉල්ලා සිටීමට හැකියාවක් නොමැත.

(ලකුණු 05)

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) 1) යම් පුද්ගලයෙකු නිත්‍යානුකූල බලයක් නොමැතිව හිතාමතාම පරිගණකයකට ප්‍රවේශවීමට හෝ පරිගණකයේ ඇති තොරතුරුවලට ප්‍රවේශවීමට යම් ක්‍රියාවක් සිදු කිරීම

2) යම් අපරාධයක් කිරීමේ අරමුණින් හිතාමතාම පරිගණකයකට ප්‍රවේශ වීමට හෝ පරිගණකයේ ඇති තොරතුරුවලට ප්‍රවේශ වීමට යම් ක්‍රියාවක් සිදු කිරීම

3) පරිගණකයක්, පරිගණක පද්ධතියක් හෝ පරිගණක වැඩසටහනක් වෙනස් කරන, ඊට අලාභ හෝ අලාභ සිදුවිය හැකි යම් ක්‍රියාවක් නිත්‍යානුකූල බලයක් නොමැතිව හිතාමතාම සිදු කිරීම

4) පරිගණකයකින් හෝ පරිගණක ගබඩා මාධ්‍යයකින් නිත්‍යානුකූල බලයක් නොමැතිව ලබාගත් තොරතුරු මිලදී ගැනීම, ලබාගැනීම, ළඟ තබාගැනීම, විකිණීම හෝ වෙනත් ඕනෑම ක්‍රියාවක් කිරීම

(b)
- 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත
- 2006 අංක 19 දරණ විද්‍යුත් ගනුදෙනු පනත
- Payment Devices Frauds Act No.30 of 2006
- 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පිළිබඳ පනත
- 2003 අංක 27 දරණ තොරතුරු සහ සන්නිවේදන පනත
- Payment and Settlements System Act No. 28 of 2005
- 1995 අංක 14 දරණ සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත
- 1991 අංක 25 දරණ ශ්‍රී ලංකා විදුලි සංදේශන පනත යටතේ අන්තර් සම්බන්ධතා පිළිබඳ රීති (1996 අංක 27 දරණ පනතින් සංශෝධනය වී ඇත.) **(ලකුණු 05)**

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a) යම් රැකියා ස්ථානයක අවම තරමේ සේවකයන් 15 ක් වත් සිටී නම් හා සේවයෙන් ඉවත්ව යන සේවකයා අවම තරමින් වසර 5 ක් වත් එම සේවායෝජක යටතේ සේවය කර ඇත්නම් පාරිතෝෂික සඳහා හිමිකම් ලබයි. නමුත් පහත සඳහන් සේවකයින්ට මෙම පනත අදාළ නොවේ.

- ගෘහ සේවකයන්
- පුද්ගලික රියදුරන්
- සමුපකාර අංශයේ සේවකයන්
- රජයේ සේවකයන්
- සේවකයින් 15 දෙනෙකුට වඩා අඩු සේවා ස්ථානයක සේවකයන්
- සේවායෝජක වෙත වසර 5 ක් වත් සේවා නොකළ සේවකයන්
- දායක නොවන විශ්‍රාම වැටුප් ක්‍රමයකට හිමිකම් කියන සේවකයන්

b)

සේවකයා විසින් අවසානයට ලැබූ වේතනයේ සාමාන්‍ය, සේවායෝජක වෙත සම්පූර්ණ කළ වසර ගණනින් ගුණකර ලැබෙන අගය පාරිතෝෂිකයක් ලෙස ලබාගත හැකිය.

**පාරිතෝෂිකය** $= \frac{\textbf{අවසාන මාසික වැටුප } x}{2}$ **සම්පූර්ණ කළ වර්ෂ ගණන**

ඒ අනුව ඩිලාන්ට රුපියල් 600,000/- ක මුදලක් පාරිතෝෂිකය ලෙස හිමිවේ.

**(ලකුණු 05)**

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

ස්වාධීනත්වයේ ස්වරූප දෙකක් ඇත.

1. මනස පිළිබඳ ස්වාධීනත්වය (Independence of mind)

   වෘත්තිකයාට කිසිදු බලපෑමකින් තොරව තම තීරණ ප්‍රකාශ කිරීමට හැකි වන ආකාරයක මානසික තත්ත්වයක් පැවතීමයි.

2. දෘෂ්ටිය පිළිබඳ ස්වාධීනත්වය (Independence in appearance)

   වෘත්තිකයාගේ මනසේ ස්වාධීනත්වයක් ඇති බව ඔහුව නිරීක්ෂණය කරන තුන්වන පාර්ශ්වයන්ට පෙනීයාමයි.

(ලකුණු 05)

aat SRI LANKA

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

ජීවිත සහ පුද්ගල හදිසි අනතුරු රක්ෂණයන් හැර අන් සියලු රක්ෂණයන් හානිපූර්ණ ගිවිසුම් වේ.
රක්ෂණ ගිවිසුම යටතේ රක්ෂකයා විසින් රක්ෂිතයාට යම් නිශ්චිත උවදුරු හේතුවෙන් සිදුවන අලාභ හානිපූර්ණය කිරීමට එකඟ වේ.
හානිපූර්ණ මූලධර්මය අනුව රක්ෂිතයාට රක්ෂණයෙන් ලාභ ලැබිය නොහැකි අතර රක්ෂිතයාට සිදු වූ අලාභයට සමාන මුදලක් පමණක් රක්ෂකයාගෙන් ලබාගත හැකිය.
සිද්ධිය අනුව පැහැදිලි වන්නේ සපරමාදු මහතාට දේපළ ගිනිගැනීම හේතුවෙන් අලාභයක් සිදුව නොමැති බවයි.
එමනිසා සපරමාදු මහතාට රක්ෂණ වන්දි හිමිකම් පෑම සඳහා අයිතියක් නොමැත.

උදා :- ***Castelain Vs Preston***

b) **චෙක්පතක ලක්ෂණ**

(1) චෙක්පතක් "ලිඛිත පත්‍රයක්" ලෙස පැවතිය යුතුය
(2) චෙක්පත් තුළ පැවතිය යුත්තේ, කොන්දේසි විරහිත අණකි.
(3) චෙක්පත් අදාළ ගණුදෙනුකරු විසින් ඔහුගේ බැංකුව වෙත අණකර තිබීම
(4) ගණුදෙනුකරු විසින් චෙක්පත් අත්සන් කර තිබිය යුතුය.
(5) චෙක්පතක් ගෙවනු ලබන්නේ ඉල්ලූවිටදී පමණකි.
(6) චෙක්පත තුළ අදාළ ගෙවිය යුතු මුදල් ප්‍රමාණය නිශ්චිතව දක්විය යුතුය.
(7) අදාළ ගෙවීම කළ යුතු පුද්ගලයා කවුරුන්ද යන්න නිශ්චිතව දක්වා තිබිය යුතුය
(8) ගිණුම්හිමියා විසින් හෝ බැංකුවේ ගණුදෙනුකරු විසින් චෙක්පත්වල නියමිත පරිදි දිනය යෙදිය යුතුය.
(9) චෙක්පත් සම්බන්ධව අදාළවන පාර්ශවයන් තුන වන්නේ, අණකරු (Drawer), අණ ලද්දා (Drawee) සහ ආදායකයාය. (Payee)

(ලකුණු 10)

## 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a) එක් පුද්ගලයෙකුට හෝ පුද්ගලයන් 50 නොවැඩි පිරිසකට සී/ස පෞද්ගලික සමාගමක් නීතිගත කිරීම සඳහා අයදුම් කළ හැකිය. එමනිසා අමින්දට ඔහුගේ ව්‍යාපාරය සී/ස පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කළ හැකිය.
ඒවාගේම සී/ස සමාගම නීතිගත කරන්නේ එක් පුද්ගලයෙකු විසින් නම් ඔහුට එම සමාගමේ 'ලේකම්' ලෙස කටයුතු කළ නොහැකිය.

b) 1. **වෙනම නෛතික පැවැත්මක් තිබීම**

සමාගමක් සංස්ථාගත කිරීමත් සමග වෙනම නෛතික තැනැත්තකු බවට පත්වේ. (සංස්ථාගත කිරීම යනුවෙන් සමාගමක් පිහිටුවීමේ ක්‍රියාවලිය අදහස් වේ). එවිට සමාගම විසින් තමා සහ එයි පිහිටුවනු ලැබූ ස්වාභාවික තැනැත්තන් අතර ගනුදෙනුවලට ඇතුළත් විය හැකිය. සමාගම විසින් ස්වකීය නඩු පවරනු ලැබීමට ද හැකියාව ඇත්තේය. තවද, සමාගමක් යනු ගිවිසුම් සඳහා එළඹීමේ හැකියාව ඇති, ව්‍යාපාරික කටයුතු කළහැකි ස්වකීය දේපළ සහ මුදල් පවත්වාගත හැකි සේවකයන් සේවයේ නියුක්ත කළ හැකි, බැංකු ගිණුම් විවෘත කරනු ලැබිය හැකි සහ මුදල් ණයට ලබාගත හැකි ආයතනයක් වශයෙන් පිළිගනු ලැබේ.

2. **සමාගම විසින් ස්වකීය සේවා නියුක්තිකයන්ට එරෙහිව නඩු පවරනු ලැබිය හැකිය**

සමාගමක වෙන් වූ නෛතික පැවැත්ම හේතුවෙන් පැන නැගිය හැකි වැදගත් ලක්ෂණයක් වනුයේ සමාගමේ සේවා නියුක්තිකයන් හා අධ්‍යක්ෂවරුන් විසින් ස්වකීය ක්‍රියාකාරකම් මගින් සමාගමට පාඩුවක් සිදුකරයි නම් එම සේවානියුක්තිකයන් සහ අධ්‍යක්ෂවරුන්ට එරෙහිව සමාගම විසින් නඩු පැවරීමේ හැකියාව ඇත.

උදාහරණයක් ලෙස, රීගල් (හස්ටින්ස්) ලිමිටඩ් එරෙහිව ගලිවර් (1942) නඩුවේදී, සමාගමේ අධ්‍යක්ෂවරුන් විසින් පාලිත සමාගමක් විකිණීමේදී, තමාට සැලකිය යුතු ලාභයක් ලැබෙනු ඇතැයි සලකමින් චේතනාන්විතව පාලිත සමාගම කොටස් මිලදී ගන්නා ලදී. අධ්‍යක්ෂවරුන් විසින් පෞද්ගලික ලාභයක් අත්කර ගැනීම සඳහා ස්වකීය අධ්‍යක්ෂධූරයක් භාවිතා කර ඇති බැවින් එම අධ්‍යක්ෂවරුන් විසින් එකී ලාභ ආපසු භාරදිය යුතු බවට අධිකරණයේ තීරණය විය.

3. **අවිච්ඡින්න පැවැත්මක් තිබීම**

තවද, සමාගමක් කොටස්හිමියන්ගෙන් සහ අධ්‍යක්ෂවරුන්ගෙන් පැහැදිලිවම වෙනස්වන අතර ඔවුන් කිසිවකුගේ ක්‍රියාකාරකම් සමාගමට බලපෑම් ඇති නොකරයි. උදාහරණයක් වශයෙන්, කොටස්හිමියකු විසින් ස්වකීය කොටස් විකිණිය හැකි අතර, අධ්‍යක්ෂවරයකු සේවයෙන් ඉල්ලා අස්වීම හෝ මියයෑම හෝ සිහිවිකල්වීම සිදුවිය හැකි නමුත්, සමාගම අඛණ්ඩව ක්‍රියාත්මකව පවතියි. සමාගම ඈවර කිරීමේදී හෝ ගණන් බේරා වසා දැමීමේදී හෝ බංකොලොත්වීමේදී පමණක් යම් සමාගමක් අවසන් වනු ඇත. සමාගමේ ජීවය සඳහා කොටස්හිමියන්ගේ ජීවිත මගින් බලපෑමක් සිදු නොකරයි.

4. **වගකීමෙන් සීමිත සමාගම් සංකල්පය**

වගකීමෙන් සීමිත සමාගමකදී, කොටස්හිමියන්ගේ කොටස් වටිනාකම දක්වා මිස, සමාගමේ ණය සම්බන්ධයෙන් කොටස්හිමියන් පුද්ගලිකව වගකීමට බැඳී නොමැත. උදාහරණයක් වශයෙන් ඔබ සීමාසහිත XY සමාගමේ කොටස්හිමියකු වේ නම් සහ ඔබ එක් කොටසක් රු. 20/- බැගින් කොටස් 10,000 ක් සන්තකය දරයි නම්, සමාගම පසුව, ස්වකීය ණයදීමනාකරුවන් සඳහා ණය ගෙවීමට සිදුවීම හේතුවෙන් රුපියල් මිලියන දෙකක මුදලක් ණයවී සමාගම බංකොලොත්වන අවස්ථාවකදී, ණයකරුවන් සඳහා ඔබගේ වගකීම ඔබගේ කොටස් වටිනාකම වන රුපියල් ලක්ෂ දෙකක් සඳහා සීමා සහිත වේ. සමාගමේ ණය සම්බන්ධයෙන් නඩු පැවරීමෙන් ඔබව නිදහස් වේ. කොටස් නිකුත් කිරීම මගින් විශාල ප්‍රාග්ධන මුදලක් එකතු කිරීමේ හැකියාව හා පුද්ගලික වගකීමෙන් බැහැරවීම සමාගම්වල වෙනත් වැදගත් ගතිලක්ෂණ වේ.

5. **වෙනම දේපළ**

සංස්ථාගත කරන ලද සමාගමක දේපළ, සමාගම වෙත පැවරී ඇත. සමාගම විසින් ස්වකීය නාමයෙන් දේපළ දැරීමේ සහ භුක්ති විඳීමේ හැකියාවක් ඇති අතර එය සමාගම්වල තවත් ගතිලක්ෂණයක් වේ. සමාගමේ කිසිඳු සාමාජිකයකු විසින් සමාගම් වත්කම් අයිතිය ඉල්ලා සිටිය නොහැකි වේ.

**(ලකුණු 10)**

## 9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) කුමාර් සහ රෝසි අතර ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන් නියෝජ්‍යත්වයක් හටගෙන ඇති බැවින් සිල්වාට කුමාර්ගෙන් අලාභ අයකරගත හැකිය.

ප්‍රතිබන්ධන රීතිය යනු යම් පුද්ගලයෙකුගේ හැසිරීම මත යම් කරුණක් සත්‍ය වන බවට තවත් පුද්ගලයෙකු වෙත විශ්වාසයක් ඇති කරවයි නම්, පසුව එම විශ්වාස කළ කරුණු අසත්‍යයක් බව පැවසීමට, විශ්වාසය ඇති කළ පාර්ශ්වයට නීතියෙන් ඉඩ ලබා නොදීමයි.

උදා :- A විසින් තම බලයලත් නියෝජිතයා ලෙස වසරක කාලයක් සඳහා B ව පත් කරයි.
වසරක කාලයෙන් පසුව B තම බලයලත් නියෝජිතයා නොවන බව ප්‍රධාන ගනුදෙනුකරුවෙකු වූ C ට නොදන්වා A නිශ්ශබ්දව සිටී.
වසරක කාලයෙන් පසුව B, A ගේ බලයලත් නියෝජිතයා යැයි සිතන C විසින් B මගින් A සමග ගිවිසුමකට ඇතුළත් වේ නම්, A හා B අතර ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන් නියෝජ්‍යත්වයක් හටගනී. A එම ගිවිසුමෙන් වගකීමට බැඳේ.

b) 1. **කාර්යය ඉටු කිරීම**

එනම් නියෝජිතයාට පැවරූ කාර්යය ඉටු කිරීමට යුතුකමින් බැඳේ. කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් ප්‍රධානියාට අලාභයක් වේ නම් එය නියෝජිතයාගෙන් අයකර ගත හැකිය.

උදා :- *Turpin Vs Bilton*

නැව් හිමියෙකු වූ A තම නැව් මුහුදු ගමන්වල යෙදෙන අවස්ථාවල දී රක්ෂණය කිරීමට B ව පත් කරන ලදී. A ගේ නැවත් මුහුදු ගමනක දී අනතුරට පත්වූ අතර, B එම නැව රක්ෂණය කර නොතිබුණි. එමනිසා A ට වූ අලාභ B විසින් ගෙවිය යුතු බව අධිකරණය තීරණය කරන ලදී.

2. **නියෝජිතයා විසමින් පුද්ගලිකවම එකී කාර්යය ඉටු කළ යුතුය.**

මෙය 'Delegatus non potest delegare' යනුවෙන් හඳුන්වනු ලබයි. එනම්, නියෝජිතයාට පැවරූ කාර්යය වෙනත් අය ලවා ඉටු කරවා ගැනීමට නියෝජිතයාට නීතිමය හැකියාවක් නොමැත. නියෝජිතයා පුද්ගලිකව එම කාර්යය ඉටු කළ යුතුය.

කෙසේ නමුත් මෙම නෛතික සිද්ධාන්තයට පහත ව්‍යතිරේඛ අවස්ථා ඇත.

කාර්යය වෙනත් අයෙකු ලවා ඉටු කරවා ගැනීමට ප්‍රධානියාගේ අනුමැතිය ලැබී තිබීම

නියෝජිතයෙකු ලෙස නෛතික පුද්ගලයෙක් පත් කර ඇති විට (සමාගම, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල) එහි නිලධාරීන් හා සේවකයන් මගින් අදාළ කාර්යය ඉටුකරවා ගැනීමට සිදුවේ.

3 **නියෝජිතයා තම කාර්යය ඉටුකිරීමේ දී සාධාරණ සැලකිල්ලක් හා දක්ෂතාවයකින් යුතුව එකී කාර්යය ඉටු කළ යුතුය.**

4 **නියෝජිතයා තමාගේ අයිතිවාසිකම් හා ප්‍රධානියාගේ අයිතිවාසිකම් අතර ගැටෙන තත්ත්වයකට තමන්ව පත් කර නොගැනීමේ යුතුකමකින් බැඳේ.**

උදා :- *Mcpherson Vs Watt*

ප්‍රධානියා තමාගේ ඉඩමක් විකිණීමට නියෝජිතයෙකු පත් කරන ලදී. එම ඉඩම තමාට ම මිලදී ගැනීමේ චේතනාව නියෝජිතයාට පැවතිය ද, ඔහු එය ප්‍රධානියාට හෙළි නොකොට ඔහුගේ සහෝදරයෙකුගේ නමින් මිලදී ගන්නා ලදී.

ඉහත කී යුතුකම නියෝජිතයා කඩ කර ඇති බව අධිකරණය තීරණය කරන ලදී. මන්ද, ප්‍රධානියාගේ ඉඩම විකිණීමට නියෝජිතයා ක්‍රියා කිරීමේදී ඔහුගේ යුතුකම වන්නේ හැකි උපරිම මිලකට එය විකිණීමට උත්සාහ ගැනීම වන අතර යමෙකු තමා වෙනුවෙන් භාණ්ඩ මිලදී ගැනීමේදී උත්සාහ වන්නේ හැකි අවම මිලට එය මිලදී ගැනීමට උත්සාහ ගැනීම වන බැවිනි.

නමුත් ප්‍රධානියාගේ අවසරය හා අනුදැනුම මත නියෝජිතයා එම භාණ්ඩ තමාටම මිලදී ගනීනම් මෙම යුතුකම කඩ නොවේ.

5 රහස් කොමිස් මුදල් ලබා නොගැනීමේ යුතුකම

ගිවිසුමකට ඇතුළු වීමෙන් පසුව නියෝජිතයා රහස් කොමිස් මුදල් ලබාගෙන ඇති බව ප්‍රධානියාට පෙනී යයි නම්, ඔහුට නියෝජිතයාට එරෙහිව මෙන් ම තුන්වන පාර්ශ්වයට එරෙහිව පහත පරිදි ක්‍රියා කළ හැකිය.

නියෝජිතයාට එරෙහිව ඇති ප්‍රතිකර්ම නියෝජිතයාගෙන්,

- ප්‍රධානියාට එම රහස් කොමිස් මුදල අයකරවා ගත හැකිය.
- පූර්ව දැනුම් දීමකින් තොරව නියෝජිතභාවය අහෝසි කළ හැකිය.
- නියෝජිතයාට ගෙවන නියෝජිත ගාස්තුව (කොමිස්, වැටුප්) ගෙවීම ප්‍රතික්ෂේප කළ හැකිය.

තුන්වන පාර්ශ්වයට එරෙහිව ඇති ප්‍රතිකර්ම

- තුන්වන පාර්ශ්වය සමග ඇතුළත් වූ ගිවිසුම අවලංගු කරවාගත හැකිය.
  මෙහිදී රහස් කොමිස් මුදල් ගෙවීම හේතුවෙන් ප්‍රධානියාට අගතියක් සිදුවීද නැද්ද යන්න වැදගත් නොවේ. අල්ලස් දීම හේතුවෙන් ප්‍රධානියා එම ගිවිසුමෙන් බැඳී නොසිටියි.
- රහස් කොමිස් මුදල් ගෙවීම හේතුවෙන් ප්‍රධානියාට අලාභයක් වී ඇත්නම් එම අලාභය අය කරවාගත හැකිය.

**(ලකුණු 10)**

***C* කොටසෙහි අවසානය.**

## D කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

a) - ප්‍රතිග්‍රහණය සන්නිවේදනය විය යුතුය යන රීතියට අදාළ එක් ව්‍යාතිරේකි අවස්ථාවක් වන්නේ තැපැල් රීතියයි. මෙම ව්‍යාතිරේකි අවස්ථාවේ දී ප්‍රතිග්‍රහණය අර්පණදායී වෙත සන්නිවේදනය නොවූව ද, පාර්ශ්වකරුවන් අතර වලංගු ගිවිසුමක් හටගනී.

- තැපැල් රීතිය යනු ප්‍රතිග්‍රහණය තැපැල් මගින් ලබාගැනීමට අර්පණදායී එකඟ වී ඇත්නම් (මෙම එකඟතාව ප්‍රකාශිත හෝ වටහාගත හැකි එකඟතාවක් විය හැකිය) අර්පණලාභී විසින් ප්‍රතිග්‍රහණ ලිපිය නිසියාකාරව තැපෑලට බාරදුන් මොහොතේ දී ම, ප්‍රතිග්‍රහණය වලංගු තත්ත්වයට පත්ව පාර්ශ්වකරුවන් අතර වලංගු ගිවිසුමක් ඇති වූ බවට සැලකේ.

- A විසින් 2016.01.02 වන දින තැපැල් මගින් අර්පණය සිදු කරන අතර එම ලිපිය 2016.01.10 වන දින B ලැබේ. ඒ අනුව අර්පණය වලංගු තත්ත්වයට පත් වන්නේ 2016.01.10 වන දින දී ය.

- ගැටලුව අනුව A විසින් තම අර්පණය තැපැල් මගින් B වෙත දැනුම් දෙන අතර ප්‍රතිග්‍රහණය දැනුම් දිය යුතු ආකාරයක් විශේෂයෙන් සඳහන් කර නොමැත. මෙවැනි අවස්ථාවක දී ප්‍රතිග්‍රහණය ද තැපැල් මගින් විය යුතු බව අර්පණදායී විසින් ව්‍යංගව අර්පණලාභී වෙත දැනුම් දුන්නා ලෙස අර්පණලාභීට සැලකිය හැකිය.

  උදා :- ***Household Fire Insurance Co. Ltd Vs Grant***

- A විසින් 2016.01.02 වන දින තැපැල් මගින් යවනු ලැබූ අර්පණ ලිපිය 2016.01.10 වන දින B ට ලැබේ. ඒ අනුව අර්පණය වලංගු තත්ත්වයට පත්වන්නේ 2016.01.10 වන දින දීය.

- B තම ප්‍රතිග්‍රහණ ලිපිය 2016.01.13 වන දින තැපැල් කරයි. ඒ අනුව තැපැල් රීතිය අනුව 2016.01.13 වන දින ප්‍රතිග්‍රහණය වලංගු තත්ත්වයට පත්ව පාර්ශ්වකරුවන් අතර වලංගු ගිවිසුමක් හටගනී.

- එසේම A විසින් නිකුත් කරන අර්පණය ඉල්ලා අස්කර ගැනීමේ ලිපිය 2016.01.18 වන දින B වෙත ලැබී ඇතත් අර්පණය ඉල්ලා අස්කර ගැනීමට පෙර එනම් 2016.01.13 වන දින ප්‍රතිග්‍රහණය වලංගු තත්ත්වයට පත්ව A සහ B අතර වලංගු ගිවිසුමක් හටගෙන ඇත. එම නිසා A ගේ අර්පණය ඉල්ලා අස්කර ගැනීම බල රහිත වේ.

- එමනිසා A ගෙන් රථය මිලදී ගැනීමට B ට අයිතිය ඇත.

b)

1. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක විෂය වස්තුව වන භාණ්ඩවලට යම් අලාභයක් සිදුවුවහොත් එය දරාගත යුත්තේ විකුණුම්කරු විසින් ද, නැතහොත් ගැනුම්කරු විසින් ද යන්න තීරණය කිරීමට, භාණ්ඩවල අයිතිය ගැනුම්කරු වෙත පැවරෙන මොහොත වැදගත් වේ.

2. මන්ද, සාමාන්‍ය රීතිය වන්නේ භාණ්ඩවල අයිතිකරු විසින් ඒවාට සිදුවන අලාභ දරාගත යුතු වන බැවිනි.

3. භාණ්ඩවල අයිතිය පැවරෙන මොහොත තීරණය කරගැනීමට අදාළ කරගත යුතු රීති 5 ක් භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ සඳහන් වේ.

4. නිමල් සහ කමල් ඇතුළත්ව ඇත්තේ විස්තර කිරීම මත අවිනිශ්චිත භාණ්ඩ විකිණීමේ ගිවිසුමකටය.

5. විස්තර කිරීම මත අවිනිශ්චිත භාණ්ඩ විකිණීම සඳහා ඇතුළුව ගිවිසුමක, එම විස්තරයට අනුරූප භාණ්ඩ විකුණුම්කරුගේ සහ ගැනුම්කරුගේ ප්‍රකාශිත හෝ ව්‍යංග එකඟතාව මත එම ගිවිසුම වෙනුවෙන් කොන්දේසි විරහිතව වෙන් කරයි නම්, එම මොහොතේදී ම එම භාණ්ඩවල අයිතිය ගැනුම්කරුට පැවරේ.

6. ගැටලුව අනුව කමල්ගේ උපදෙස් අනුව නිමල් විසින් භාණ්ඩ ගිවිසුම වෙනුවෙන් වෙන් කර ඇත.

7. පසුව එම භාණ්ඩ විනාශ වී ඇති බැවින් ගැනුම්කරු වන කමල් විසින් භාණ්ඩවලට සිදුව ඇති අලාභ දරාගත යුතුය.

**(ලකුණු 25)**

***D* කොටසෙහි අවසානය.**

## *Notice :*

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2017 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*